# නාවික හමුදාවෙන් කච්චතිව් අවට මුහුදේ නව සිතියමක්

(ඉන්දිකා රාමනායක)

කච්චතිව් දූපතේ වටප්‍රමාණය හා ඒ අවට මුහුදු සීමාවේ ගැඹුර ආවරණය වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජල මානක විද්‍යා අංශය මගින් සකස් කරන ලද ප්‍රථම නාවික සිතියම පසුගියදා එළිදැක්වීය.

නාවික හමුදාව දැනට පරිහරණය කරන්නේ ඉංග්‍රීසි පාලන සමයේ ඉංග්‍රීසි ජාතිකයින් විසින් සකස් කරන ලද සිතියම් බවත් එම සිතියම්වල දැනට මුහුදු පතුල හා සාගර කලාපවල යම් යම් වෙනස්කම් ඇති බව ද නාවික හමුදාව කියයි.

කුඩා යාත්‍රා මගින් එකෝ සවුන්ඩර් ශබ්ද තරංග මගින් මුහුදු පතුලේ ගැඹුර මැනීම සිදුකළ බව ද නාවික හමුදාව කියයි.

යුද සමයේ නාවික හමුදා සාමාජිකයන් යුද කටයුතුවලට යොමුවීම හේතුවෙන් මෙම අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් මෙම කටයුතු භාරා ආයතනයට පැවරී තිබූ බව ද නාවික හමුදාව සඳහන් කරයි.

යුද්ධය නිමා වීමෙන් පසු සාගර කලාපයේ නාවික කටයුතු පහසු කිරීමට හා යාත්‍රාවන් අනතුරක නොවැටී ආරක්ෂිතව යාත්‍රාකරවීම පහසු කිරීම සඳහා මෙම සිතියම් වැදගත් වන බව ද නාවික හමුදාව සඳහන් කරයි.

ජල මානක විද්‍යා අංශය මගින් සිතියම් ගත කළ ප්‍රථම සිතියම ප්‍රධාන ජල මානක විද්‍යා නිලධාරි රියර් අද්මිරාල් සිසිර ජයකොඩි මහතා විසින් නාවික හමුදාපති වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා වෙත නාවික හමුදා මූලස්ථානයේ දී ප්‍රදානය කෙරිණි.



ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජල මානක විද්‍යා අංශය මගින් සකස් කළ ප්‍රථම සිතියම ප්‍රධාන ජල මානක විද්‍යා නිලධාරි රියර් අද්මිරාල් සිසිර ජයකොඩි මහතා විසින් නාවික හමුදාපති වයිස් අද්මිරාල් සිරිමෙවන් රණසිංහ මහතා වෙත පිරිනැමූ අයුරු.